# ජාතික අයවැය

# කුමක් සඳහා ද - කා වෙනුවෙන් ද

# 2023

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

2022/11/14

# හැඳින්වීම

2023 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2022 ඔක්තෝම්බර් 18 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2023 අයවැය 2022 නොවැම්බර් 14 වැනි දින ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රකාශනය මගින් 2023 අයවැය ඇස්තමේතු තුල වන වියදම් ප්‍රධාන  ආර්ථික ක්ෂේත්‍ර 11 කට සාරාංශ ගත කර ඇති අතර එමගින් මහජන මුදල් ආයෝජනය කිරීම පිළිබඳ පුළුල් දැක්මක් ලබා දීමට අපේක්ෂා කෙරේ.  අයවැය ඇස්තමේන්තු සම්මත ගිණුම්කරණ ආකෘතිවලට අනුව මුද්‍රණය කර ඇති අතර මෙහි සඳහන් සාරාංශය  ඉන් වෙනස් විය හැක. භාවිතයේ පහසුව සඳහා ඇස්තමේන්තුගත මුදල ආසන්නතම බිලියන දක්වා වටයන ලදී.

## “සෞඛ්‍ය සම්පන්න සමාජයක් කරා.....”



සෞඛ්‍ය

## 2023 දී සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා රු. බිලියන 433 ක්



සැමට නොමිලේ ඖෂධ

රු. බිලියන 110




“1990 සුවසැරිය” ගිලන් රථ සේවය

රු. බිලියන 2.4




රෝහල් සේවා කළමනාකරණය

රු. බිලියන 38

සෞඛ්‍ය

**ත්‍රිපෝෂ වැඩසටහන**
**රු. බිලියන 12.2**



**සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය**
**රු. බිලියන 62**

## දිවයින පුරා පවතින රෝහල් ජාලය







### තෘතියීක සත්කාර රෝහල්

**ජාතික රෝහල් 2**
**ශික්ෂණ රෝහල් 11**
**විශේෂිත රෝහල් 18**

කාසල් වීදිය කාන්තා රෝහල
ද සොයිසා මාතෘ රෝහල
රිජ්වේ ආර්යා ළමා රෝහල
ජාතික දන්ත රෝහල
මහමෝදර විශේෂිත ශික්ෂණ රෝහල
ජාතික බෝවන රෝග විද්‍යායතනය
අපේක්ෂා රෝහල, මහරගම
ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය
ජාතික අක්ෂි රෝහල
වෘක්කවේද, කාන්දු පෙරණ හා වකුගඩු බද්ධ කිරීමේ ජාතික මධ්‍යස්ථානය
ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල
ලාදුරු රෝහල, හැඳල
රක්තවාතවේද හා පුනරුත්ථාපන රෝහල, රාගම
කේතුමතී කාන්තා රෝහල
සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල

**දිස්ත්‍රික් මහ රෝහල් 19**
**පළාත් මහ රෝහල් 1**




**ද්විතියික සත්කාර රෝහල්**

**මූලික රෝහල් 82**



**ප්‍රාථමික සත්කාර රෝහල්**

**ප්‍රාදේශීය රෝහල් 479**

**ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක 514**

## සෞඛ්‍ය අංශයේ සුවිශේෂිතා

| අංශය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලි) |
|---|---|---|
| සැමට නොමිලේ ඖෂධ | සියලුම රජයේ රෝහල් සඳහා ඖෂධ, ශල්‍ය අයිතම සහ රසායනාගාර ද්‍රව්‍ය ලබාදීම | 110 |
| ත්‍රිපෝෂ වැඩසටහන | ගැබිණි මව්වරුන්, කිරි දෙන මව්වරුන් (දරුවාගේ වයස මාස 06 දක්වා), වයස මාස 06ට වැඩි ළදරුවන් සහ මන්දපෝෂණයෙන් පෙළෙන වයස අවුරුදු 05 ට අඩු පෙර පාසල් දරුවන් සඳහා මසකට ග්‍රෑම් 750 පැකට් 02 ක් නොමිලේ බෙදා දීම. | 12.2 |
| සෞඛ්‍ය සේවාවේ මෙහෙයුම් සහ නඩත්තු සේවා | රෝහල් සහ ආයතනවල නඩත්තු සහ උපයෝගිතා සේවා වියදම්, නේවාසික රෝගීන් සඳහා ආහාර, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 38.0 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සහ ශක්තිමත් කිරීම | 27.8 |

| අංශය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලි) |
|---|---|---|
| සෞඛ්‍ය සේවා ජාලයේ සංවර්ධනයන් | • එක්ස් රේ ඒකකය, බාහිර රෝගී අංශය, හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය හා ලේ බැංකුවකින් සමන්විත තෙමහල් ගොඩනැඟිල්ලක් ඉදි කිරීම - මූලික රෝහල පිඹුර<br>• දිවයින පුරා රෝහල් 13ක් ඉදිකිරීම (ප්‍රාදේශීය රෝහල් - දර්ගා නගරය, අලුත්ගම සහ මූලික රෝහල් - මීරිගම, සමන්තුරේ, එරාවුර්, පොතුවිල්, කල්පිටිය, රිකිල්ලගස්කඩ, මැදිරිගිරිය, පදවිය, වලස්මුල්ල, මහියංගනය, කලවාන)<br>• උතුරු පළාත් රෝහල් සංවර්ධනය (මූලික රෝහල් – පේදුරු තුඩුව, මාන්කුලම් සහ දිස්ත්‍රික් මහ රෝහල්-කිළිනොච්චි, වවුනියාව)<br>• මහනුවර ජාතික රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකය ඉදිකිරීම<br>• ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 17.2 |
| මාතෘ සහ ළමා සත්කාර සේවා | ගර්භණී සංකූලතා සඳහා විශේෂිත මධ්‍යස්ථානය - කොළඹ (ද සොයිසා)<br>මාතෘ හා ළමා රෝහල් - කළුතර, කොළඹ (ද සොයිසා), කරාපිටිය<br>සාඵල්‍යතා ප්‍රතිකාර ඒකකය - කාසල් වීදිය කාන්තා රෝහල<br>ළමුන් සඳහා හෘද රෝග ප්‍රතිකාර මධ්‍යස්ථානය - රිජ්වේ ආර්යා ළමා රෝහල | 7.4 |
| බෝවන සහ බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම | බෝ නොවන රෝග සහ බෝවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා දීප ව්‍යාප්තව සිදු කරනු ලබන ක්‍රියාකාරකම්<br>බෝ නොවන රෝග - හෘද රෝග, පිළිකා, නිදන්ගත ස්වසන රෝග, දියවැඩියාව ආදිය<br>බෝවන රෝග - ජලභීතිකාව, ඩෙංගු, ලිංගාශ්‍රිත රෝග/ ඒඩ්ස්, ක්ෂය රෝගය, ලාදුරු ආදිය | 5.7 |
| වෛද්‍ය උපකරණ සැපයීම | රෝහල් සඳහා ජීව වෛද්‍ය උපකරණ, රසායනාගාර උපකරණ සහ ලේ බැංකු උපකරණ මිලදී ගැනීම | 3.9 |
| 1990 සුවසැරිය ගිලන්රථ සේවය | සියලුම පුරවැසියන් සඳහා පූර්ව රෝහල් සත්කාර ගිලන්රථ සේවාව පැය 24 පුරා නොමිලේ සැපයීම. (දැනට පවතින ගිලන්රථ 297ක ප්‍රමාණය තවත් ගිලන් රථ 25ක් යෙදවීමෙන් වැඩි කෙරේ.) | 2.4 |

| අංශය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලි) |
|---|---|---|
| සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය | වෛද්‍යවරුන් සඳහා විදේශීය පශ්චාත් උපාධි අවස්ථා සහ අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම | 1.6 |
| පිළිකා රෝගීන් සඳහා කලාපීය ප්‍රවේශය වැඩි දියුණු කිරීම | රත්නපුර, කුරුණෑගල සහ හම්බන්තොට රෝහල් සඳහා උසස් තත්ත්වයේ අධි ශක්ති විකිරණ උපකරණ ලබා දෙමින් පිළිකා ප්‍රතිකාර පහසුකම් සංවර්ධනය කිරීම | 0.8 |
| හදිසි ප්‍රතිකාර ඒකක වැඩි දියුණු කිරීම | යාපනය හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම | 0.2 |
| දිවයින පුරා ඖෂධ පවතින බව සහතික කිරීම | වෛද්‍ය සැපයුම් ගබඩා පහසුකම් ඉදිකිරීම සහ ඒකාබද්ධ වෛද්‍ය සැපයුම් තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම | 0.17 |
| ආඝාතය සහ හෘද රෝග සඳහා ප්‍රතිකාර සේවා පුළුල් කිරීම | මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ආඝාත මධ්‍යස්ථානය ඉදිකිරීම සහ මඩකලපුව ශික්ෂණ රෝහලෙහි හෘද රෝග ඒකකය කැතීටර් ලැබ්, රසායනාගාර සංකීර්ණය සහ වාට්ටු සංකීර්ණය ඉදිකිරීම | 0.12 |
| දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම | ආයුර්වේද ප්‍රතිකාර සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දීම සහ දේශීය වෛද්‍ය සේවාව සංවර්ධනය කිරීම | 0.64 |
| අයවැය යෝජනාව | ළමා පෝෂණය වැඩි දියුණු කිරීම | 0.50 |

අධ්‍යාපන

# “21 වැනි සියවසේ සහ ඉන් ඔබ්බෙහි අභියෝගවලට මුහුණ දීම සඳහා අධ්‍යාපනයේ සුසමාදර්ශී වෙනසක්”

## 2023 දී අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා රුපියල් බිලියන 505 ක්

**සාමාන්‍ය අධ්‍යාපනය රු.බිලියන 392**

**විශ්වවිද්‍යාල අධ්‍යාපනය රු.බිලියන 97**



**වෘත්තීය පුහුණුව, නිපුණතා අධ්‍යාපනය සහ පර්යේෂණ රු.බිලියන 15**

### සාමාන්‍ය අධ්‍යාපනය – රු.බිලියන 392

| | | |
|---|---|---|
| පාසල් අධ්‍යාපනය රු.බිලියන 297.6 | පිරිවෙන් සහ විශේෂ අධ්‍යාපනය රු.බිලියන 6.3 | ගුරු සංවර්ධනය රු.බිලියන 3 |
| යටිතල පහසුකම් සංවර්ධනය රු.බිලියන 18 | විභාග පැවැත්වීම සහ ඇගයීම රු.බිලියන 10 | සිසුන් සඳහා ශිෂ්‍යත්ව සහ සුබසාධන වැඩසටහන් රු.බිලියන 57 |





## සාමාන්‍ය අධ්‍යාපනයෙහි ප්‍රධාන ආයෝජන ක්ෂේත්‍රයන්

| ක්ෂේත්‍රය | විස්තරය | ආයෝජනය රු.බිලියන |
|---|---|---|
| **පාසල් අධ්‍යාපනය**<br>මුළු පාසල් – 10,155<br>• ජාතික පාසල් - 396<br>• පළාත් පාසල් - 9,759<br>සිසුන් මිලියන - 4.1 | ජාතික සහ පළාත් පාසල්වල ගුරුවරුන් 249,494 ද ඇතුලත්ව වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් | 297.6 |
| **පිරිවෙන් හා විශේෂ අධ්‍යාපනය** | පිරිවෙන් අධ්‍යාපනය සහ විශේෂ අධ්‍යාපනය ශක්තිමත් කිරීම | 6.3 |
| **විභාග පැවැත්වීම හා ඇගයීම** | ජාතික මට්ටමේ පාසල් විභාග පැවැත්වීම සහ ඇගයීම | 10.0 |
| **සිසුන් සඳහා වූ ශිෂ්‍යත්ව සහ සුබසාධන වැඩසටහන්** | පාසල් 8,350 ක සිසුන් මිලියන 1.1 ක් සඳහා පෝෂ්‍යදායී ආහාර ලබාදීම<br>(ආහාර ලබාදීමේ වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් පළාත් සභාව වෙත ප්‍රතිපාදන වෙන් කර ඇත.) | 19.1<br>රේඛීය අමාත්‍යාංශය - 2.5<br>පළාත් සභා - 16.6<br>• බස්නාහිර –2.1<br>• මධ්‍යම –2.0<br>• දකුණ- 2.2<br>• වයඹ- 1.9<br>• උතුර- 1.3<br>• නැගෙනහිර- 1.9<br>• උතුරු මැද- 1.6<br>• ඌව- 1.6<br>• සබරගමුව - 1.4 |
| | 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන් මිලියන 4.1 කට පමණ පාසල් පෙළ පොත් ලබාදීම, ගුරු මාර්ගෝපදේශ සහ 2023 දී හඳුන්වා දීමට නියමිත නව විෂයමාලා මොඩියුල මුද්‍රණය | 30.0 |

අධ්‍යාපන

අධ්‍යාපන

| ක්ෂේත්‍රය | විස්තරය | ආයෝජනය රු.බිලියන |
|---|---|---|
| | මිලියන 4.1 ක් පමණ වන සිසුන් සඳහා පාසල් නිල ඇඳුම් ලබා දීම | 3.5 |
| | දුෂ්කර හා අති දුෂ්කර පාසල්වල සිසුන් 700,000 ක් සඳහා පාවහන් ලබා දීම | 1.2 |
| | "5 ශ්‍රේණියේ" ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන් 125,000කට ශිෂ්‍යත්ව ලබාදීම | 0.9 |
| | සියලුම සිසුන් ආවරණය වන පරිදි "සුරක්ෂා" සෞඛ්‍ය රක්‍ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 2.0 |
| **පාසල් වල යටිතල පහසුකම් සංවර්ධනය** | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | 1.8 |
| | තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක් ස්ථාපිත කිරීම | 1.4 |
| | අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීම | 1.5 |
| | පාසල්වල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ( ICT) මධ්‍යස්ථාන පිහිටුවීම | 1.7 |
| | ජාතික පාසල් 1000 ක පහසුකම් වැඩි දියුණු කිරීම | 1.2 |
| | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය | 1.8 |
| | අධ්‍යාපනය හා බැඳුනු අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම | 8.6 |
| **ගුරු සංවර්ධනය** | ගුරු සංවර්ධනය ආශ්‍රිත වැඩසටහන් | 2.4 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19 ක සිසුන් 12,079 ක් සඳහා ආහාර දීමනා ලබාදීම | 0.6 |
| **අයවැය යෝජනාව** | ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම | 0.2 |

## විශ්වවිද්‍යාල අධ්‍යාපනය - රු. බිලියන 97

| ක්ෂේත්‍රය | රු. බිලියන |
|---|---|
| රාජ්‍ය විශ්වවිද්‍යාලවල මානව සම්පත් කළමනාකරණය සහ අනෙකුත් මෙහෙයුම් වියදම් | 58.2 |
| යටිතල පහසුකම් සහ ගුණාත්මක සංවර්ධනය සඳහා වන ව්‍යාපෘති | 18.6 |
| රාජ්‍ය විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් පවත්වාගෙන යාම හා සංවර්ධනය | 8.9 |
| කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) | 8.2 |
| විශ්වවිද්‍යාලවල සිසුන් සඳහා "මහපොළ " සහ වෙනත් සුභ සාධන වැඩසටහන් | 2.7 |



## විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි ප්‍රධාන ආයෝජන ක්ෂේත්‍රයන්

| ක්ෂේත්‍රය | විස්තරය | ආයෝජනය රු. බිලියන |
|---|---|---|
| **මෙහෙයුම් සහ කළමනාකරණය** | විශ්වවිද්‍යාල 19ක පශ්චාත් උපාධි ආයතන 03ක සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන 11ක 11,030ක් වන අධ්‍යයන හා 14,143ක් වන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම | 52.2 |
| **සුබසාධන වැඩසටහන්** | විශ්වවිද්‍යාල සිසුන් 95,530 ක් සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම සඳහා භාණ්ඩාගාර දායකත්වය | 1.7 |
| | රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ සිසුන් සඳහා උසස් අධ්‍යාපන ණය සහන ලබාදීම - ප්‍රතිලාභීන් සංඛ්‍යාව 9,183 | 1.0 |
| **උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය සහ යටිතල** | විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සබරගමුව, රජරට, කැලණිය යන විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ස්ථාපනය කිරීම | 9.7 |
| | උසස් අධ්‍යාපන කඩිනම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම | 4.9 |

| ක්ෂේත්‍රය | විස්තරය | ආයෝජනය රු. බිලියන |
|---|---|---|
| **පහසුකම් සංවර්ධනය** | වයඹ විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ 90%කින් නිමකිරීම හා විශ්වවිද්‍යාලය තුළ වඩා හොඳ ඉගැන්වීම් හා ඉගෙනුම් පරිසරයක් ඇතිකිරීම | 2.0 |
| | කොළඹ විශ්වවිද්‍යාලයේ මහල් 17කින් යුත් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම හා ඒ සඳහා දේශීය බැංකුවලින් ලබාගත් ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම | 1.4 |
| | නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිලි සංකීර්ණයන්හි ඉදිකිරීම් නිමකිරීම සහ විශ්වවිද්‍යාලය තුළ වඩා හොඳ ඉගෙනුම් හා ඉගැන්වීම් පරිසරයක් ඇතිකිරීම | 1.0 |
| | සබරගමුව විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමේ (අදියර ii) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ 30%ක භෞතික ප්‍රගතියක් අත්කරගැනීම | 1.0 |
| | රජරට, වයඹ, කැලණිය, යාපනය සහ අග්නිදිග විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ ස්ථාපිත කිරීම සහ විශ්වවිද්‍යාල සිසුන් 14,303ක් සඳහා තාක්ෂණික විෂය ධාරාව හැදෑරීමට වඩා හොඳ ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම | 0.9 |
| අයවැය යෝජනා | වෛද්‍යවරුන් සඳහා දේශීය පශ්චාත් - උපාධි අධ්‍යාපන අවස්ථා වැඩි දියුණු කිරීම | 0.06 |
| | තත්ත්ව සහතික සහ ප්‍රතීතන පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීම | 0.1 |
| | වෛද්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම | 0.2 |
| | දේශගුණික විපර්යාස සඳහා ජාත්‍යන්තර විශ්ව විද්‍යාලය | 0.1 |

## වෘත්තීය පුහුණුව, නිපුණතා අධ්‍යාපනය සහ පර්යේෂණ – රු. බිලියන 15

| ක්ෂේත්‍රය | රු. බිලියන |
|---|---|
| මානව සම්පත් කළමනාකරණය සහ වෙනත් මෙහෙයුම් වියදම් | 7.5 |
| විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය, විද්‍යාතා වැඩසටහන, ග්‍රහලෝකාගාරය සහ අනෙකුත් පර්යේෂණ ආයතන | 2.1 |
| වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය සහ අදාල ආයතන | 4.9 |
| වෘත්තීය අධ්‍යාපනය හදාරණ සිසුන් සඳහා “නිපුණතා සිසු දිරිය” හා වෙනත් සුභ සාධන වැඩසහන් | 0.6 |

## ප්‍රධාන ආයෝජන ක්ෂේත්‍රයන්

| ක්ෂේත්‍රය | විස්තරය | ආයෝජනය රු. බිලියන |
|---|---|---|
| **මෙහෙයුම් සහ කළමනාකරණය** | විද්‍යාඥයින්, උපදේශකයින් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ පුද්ගල පඩිනඩි සහ වෙනත් වියදම් | 7.5 |
| **විද්‍යාතා වැඩසටහන** | දැනුවත් කිරීමේ වැඩසටහන්, ධාරිතා සංවර්ධන වැඩසටහන්, තාක්ෂණික ප්‍රමිතිකරණ වැඩසටහන් | 0.7 |
| **සුබසාධන වැඩසටහන්** | 20,000ක් පමණ වන සිසුන් සඳහා නිපුණතා සිසු දිරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් ශිෂ්‍යත්ව ලබාදීම | 0.6 |
| **වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය** | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 0.4 |
| | තරුණ තරුණියන්ගේ රැකියා, ස්වයං රැකියා, නිපුණතා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය උදෙසා "You Lead" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 0.4 |
| | තාක්ෂණික විශ්වවිද්‍යාල 7ක් නවීකරණය කිරීම ඔස්සේ වෘත්තීය අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය උත්ශ්‍රේණිගත කිරීම | 0.3 |
| | වෘත්තීය හා තාක්ෂණික ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම සඳහා යාපනය, කෑගල්ල NAITA පුහුණු මධ්‍යස්ථාන හා VTA පුහුණු මධ්‍යස්ථාන 5ක ඉදිකිරීම් වැඩ අවසන් කිරීම | 0.3 |
| | කෑගල්ල නගර විශ්වවිද්‍යාලය පිහිටුවීම හා ශිෂ්‍යයින් ඇතුලත් කරගැනීම් | 0.2 |

# සවිබල ගැන්වූ හා ඵලදායී මානව සම්පතක් උදෙසා

## 2023 දී සාධාරණ සමාජයක් උදෙසා මානව සම්පත් සංවර්ධනය - රු. බිලියන 53

මානව සම්පත් සංවර්ධනය

තාරුණ්‍යය සවිබල ගැන්වීම
රු. බිලියන 10.2



ආගමික හා සංස්කෘතික කටයුතු
රු. බිලියන 7.9



ඵලදායි ශ්‍රම බලකායක්
රු. බිලියන 6.8



දැනුවත් සමාජයක්
රු. බිලියන 28.1



## මානව සම්පත සඳහා වූ ප්‍රධාන ආයෝජන ක්ෂේත්‍ර

| අංශය | කාර්යයන් | ආයෝජනය (රු. බිලියන) |
|---|---|---|
| **තාරුණ්‍යය සවිබල ගැන්වීම** | තාරුණ්‍යය සහ ක්‍රීඩා සංවර්ධනය සම්බන්ධ මෙහෙයුම් ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම | 7.9 |
| | කුසලතා සංවර්ධනයට පහසුකම් සැලසීම | 0.5 |
| | ජාතික සංචිත සඳහා පෝෂණීය ආහාර සැපයීම | 0.3 |
| | පළාත් සහ දිස්ත්‍රික් ක්‍රීඩා තරඟ සඳහා පහසුකම් සැලසීම | 0.5 |
| | ක්‍රීඩා සංවර්ධනයේ ඉදිකිරීම් සඳහා පහසුකම් සැලසීම | 0.7 |
| **ආගමික හා සංස්කෘතික කටයුතු** | සංස්කෘතික කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ සමාජ සංස්කෘතික ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම | 1.6 |
| | ආගමික කටයුතු නඟා සිටුවීම | 3.4 |
| | ජාතික උරුමයන් ප්‍රවර්ධනය තහවුරු කිරීම | 2.8 |
| **ඵලදායී ශ්‍රම බලකායක්** | වැටුප් හා වේතන ඇතුළුව මෙහෙයුම් කාර්යයන් සඳහා පහසුකම් සැලසීම | 4.9 |
| | ආරක්ෂිත සහ විධිමත් කම්කරු සංක්‍රමණ සඳහා සහාය වීම | 0.3 |
| | සේවක සුරක්ෂිතතාවය ඇතුළුව ඵලදායී සේවා සැපයුමක් සඳහා පහසුකම් සැලසීම | 1.6 |
| **දැනුවත් සමාජයක්** | ජනමාධ්‍ය සඳහා පහසුකම් සැලසීම | 0.5 |
| | මුද්‍රණ, වාණිජ මුද්‍රණ සහ පොත් බැඳීම්වලට සහාය වීම | 5.8 |
| | තොරතුරු බෙදා හැරීම | 0.6 |
| | තැපැල් සේවා කළමනාකරණය හා ප්‍රවර්ධනය කිරීම | 20.0 |
| අයවැය යෝජනා | ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට වෙනම ආයතනයක් | 0.05 |
| | විදේශ රැකියා සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම - ජාතික තරුණ සේවා සභාව | 0.05 |

මානව සම්පත් සංවර්ධනය

# කිසිවෙකු මගහැරෙන්න දෙන්න එපා

## සමාජ ආරක්ෂණය - රු.බිලියන 635

සමාජ ආරක්ෂණය

විශ්‍රාමිකයින් 714,800 ක් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ

**රු. බිලියන 375.0**






ආබාධිත සෙබළුන් සඳහා සමාජ ආරක්ෂාව

**රු.බිලියන 42.5**

කුටුම්භයන් වෙත මුදල් ප්‍රදාන සහ ආහාර සහන

**රු.බිලියන 187.0**

(අයවැය යෝජනා ද ඇතුලත්ව)





සංවර්ධන සහායන්

**රු.බිලියන 31.2**

**සමාජ ආරක්ෂණය**

රු.බිලියන **187**

## කුටුම්භයන් වෙත මුදල් ප්‍රදාන **සහ ආහාර සහන**

| **වර්ගය** | **රු.බිලියන** |
|---|---|
| ප්‍රතිලාභීන් මිලියන 1.7 කට පමණ සමෘද්ධි සහන ලබා දීම | **66.0** |
| වැඩිහිටියන් සඳහා මූල්‍ය ආධාර | **14.5** |
| ගර්භනී මව්වරුන් සඳහා පෝෂණ ආහාර පැකේජය | **11.0** |
| අඩු ආදායම්ලාභී අබාධිත පුද්ගලයන් සඳහා මූල්‍ය සහාය | **8.0** |
| වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර | **2.8** |
| පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය | **1.5** |
| උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ට පෝෂණ අතිරේකය | **0.5** |
| ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය යථා තත්ත්වයට පත්කිරීම | **8.0** |
| ත්‍රිපෝෂ වැඩසටහන* | **12.2** |
| පාසල් පෝෂණ ආහාර වැඩසටහන* | **19.1** |
| **අයවැය යෝජනා** | |
| දුෂ්කර ආර්ථික තත්ත්වයෙන් පීඩාවට පත් ජනතාවට සහන ලබා දීම | **43.0** |
| මාසික සමෘද්ධි දීමනාවට අමතරව අවම වශයෙන් රු. 3000 ක් මාස 4 ක කාලයක් සඳහා ලබා දීම | 20.75 |
| වැඩිහිටි දීමනාව වැඩි කිරීම | 3.00 |
| අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ලබා දෙන දීමනාව වැඩි කිරීම | 0.25 |
| වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව වැඩි කිරීම | 0.20 |
| පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් විපතට පත් පවුල් සඳහා සහන ලබා දීම | 18.80 |
| වැඩිහිටි,ආබාධිත, අඩු ආදායම් ලබන සහ වැන්දඹුවන් ගෘහ ව්‍යවසායකයන් ලෙස ශක්තිමත් කිරීම | **0.25** |

රු.බිලියන **31.2**

## සංවර්ධන සහායන්

| **වර්ගය** | **රු.බිලියන** |
|---|---|
| නාගරික පුනර්ජනන වැඩසටහන (URP)- නිවාස සහනාධාරය* | **11.7** |
| ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් සඳහා පොලී සහනාධාරය* | **10** |
| ආදායම් නොලබන මාර්ගවල බස්රථ ධාවනය සඳහා සහනාධාර* | **4.0** |
| සහනාධාර ණය යෝජනා ක්‍රම | **2.8** |
| රාජ්‍ය සේවකයින් සඳහා දේපළ ණය පොලී ප්‍රතිපූර්ණය | **2.7** |

- * - මෙම වැඩසටහන් අදාල අංශ වලද ඇතුලත් කර ඇත.

ප්‍රවාහන

# “රටට උචිත වේගවත්, ආරක්ෂිත සහ පහසු ප්‍රවාහන ජාලයක්”

## 2023 දී ප්‍රවාහන සංවර්ධනය සඳහා රුපියල් බිලියන 396 ක්

**මාර්ග ජාලය - කිලෝමීටර 150,000 ක් පමණ**

- ජාතික මාර්ග - කිලෝමීටර් 12,536
- පළාත් මාර්ග - කිලෝමීටර් 18,848
- ග්‍රාමීය මාර්ග - කිලෝමීටර් 100,000 කට වඩා
- අධිවේගී මාර්ග - කිලෝමීටර 312

**දුම්රිය මාර්ග**

- දුම්රිය මාර්ග - කිලෝමීටර් **1,492**
- දුම්රිය එන්ජින් ගණන - **111**
- ඩීසල් බහු ඒකක - **79**
- මගී කෝච්චි ගණන - **750**
- දුම්රිය ස්ථාන ගණන - **428** (සියලු වර්ග)



## ගොඩබිම් ප්‍රවාහනය සඳහා රුපියල් බිලියන 87 ක්

| | |
|---|---|
| දුම්රිය ඇණිය සහ අනෙකුත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම | රු.බි. 9.6 |
| රේල් පාර සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | රු.බි.19.2 |
| දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම | රු.බි. 1.2 |
| අදාළ ආයතන සඳහා ආයතනික සහාය | රු.බි. 33.6 |
| ලංගම බස් රථ ඇණිය ශක්තිමත් කිරීම | රු.බි. 5.2 |
| වාර ප්‍රවේශ පත්‍ර, බස් පාස් සහ අනෙකුත් සුබසාධන | රු.බි. 16.2 |



## මාර්ග සඳහා රුපියල් බිලියන 305 ක්

| | |
|---|---|
| අධිවේගී මාර්ග සංවර්ධනය | රු.බි. 93.0 |
| මාර්ග සංවර්ධනය | රු.බි. 177.0 |
| මාර්ග නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම | රු.බි. 9.0 |
| පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම | රු.බි. 14.6 |
| ආයතනික සහාය | රු.බි. 9.0 |
| අයවැය යෝජනා | රු.බි. 2.1 |

## වරාය සහ ගුවන් සේවා සඳහා රුපියල් බිලියන 3.68 ක්

| | |
|---|---|
| වරාය සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | රු.බි. 2.1 |
| ආයතනික සහාය | රු.බි. 1.5 |



## අංශයේ විශේෂ ආයෝජන

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | **2023** ආයෝජනය **(රු. බිලියන)** |
|---|---|---|
| අධිවේගී මාර්ග සංවර්ධනය | කිලෝමීටර් 39ක් දිග කඩවත මීරිගම අධිවේගී මාර්ගය ඉදිකිරීම | 45.1 |
| | ඉඟුරුකඩේ හන්දියේ සිට වරාය නගරය දක්වා කිලෝමීටර් 5.3ක් දිග කුළුණු මතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය ඉදිකිරීම | 25.0 |
| | පොතුහැර සිට රඹුක්කන දක්වා කිලෝමීටර් 12ක් දිග මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම | 8.5 |
| | අධිවේගී මාර්ගයේ සෑම අන්තර් හුවමාරුවකදීම ස්වයංක්‍රීයව ගාස්තු එකතු කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම | 5.0 |
| මාර්ග වැඩිදියුණු කිරීම සහ අනෙකුත් මාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | • කුරුණෑගල, පුත්තලම, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර, කෑගල්ල, මහනුවර, මාතලේ, නුවරඑළිය, අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, ගම්පහ, කිලිනොච්චිය, යාපනය, කොළඹ, මන්නාරම, මුලතිව්, වවුනියාව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 5,000ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීම,<br>• පස්යාල හන්දියේ සිට කඩුගන්නාව දක්වා කොළඹ නුවර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම<br>• බැලුම්මහර - කඩුවෙල - කැලණිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | 46.8 |
| | කිලෝමීටර 140ක් දිග බදුල්ල - චෙන්කලඩි මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | 5.2 |
| | දිවයින පුරා කිලෝමීටර් 1,000ක පමණ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 13.0 |
| | මහනුවර නගර ප්‍රදේශයේ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම | 6.3 |
| | පාලම් 6 ක් ඇතුළුව ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය කිලෝමීටර 7.4 ක්, මහරගම - පිළියන්දල මාර්ගය කිලෝමීටර් 5.4 ක් සහ කොට්ටාව - තලගල මාර්ගය කිලෝමීටර් 14.5 ක් වැඩිදියුණු කිරීම. | 1.3 |
| | A17 මාර්ගයේ දෙනියාය සිට රක්වාන දක්වා කොටසක් වැඩිදියුණු කිරීම | 1.9 |
| | ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීමට විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම | 30.0 |
| | මධ්‍යම අධිවේගී මාර්ගය, රුවන්පුර අධිවේගී මාර්ගය, නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණුමතින් දිවෙන අධිවේගී මාර්ගය ඇතුළු මාර්ග ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම. | 8.7 |
| | කෑගල්ල, මහනුවර, මන්නාරම, පුත්තලම, මුලතිව්, ගම්පහ දිස්ත්‍රික්කවල ජාතික මාර්ගවල පාලම් 25 ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම. | 1.0 |

ප්‍රවාහන

| | | |
|---|---|---|
| පාලම් සහ ගුවන් පාලම් | ගුවන් පාලම් පහක් ඉදිකිරීම<br>• උත්තරානන්ද මාවත සහ විනිසුරු අක්බර් මාවත අසල දුම්රිය මාර්ගයට ඉහළින්, බාලදක්ෂ මාවත චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත සමඟ සම්බන්ධ කිරීම<br>• කොහුවල<br>• ගැටඹේ | 3.1 |
| ගොඩබිම් ප්‍රවාහනය (දුම්රිය සහ බස්) ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය | පරිශීලක හිතකාමී තාක්‍ෂණය සහ බහු ගෙවීම් විකල්ප සමඟ දුම්රිය ස්ථාන 340ක් සඳහා දුම්රිය ආසන වෙන්කරවා ගැනීම ඇතුළුව ප්‍රවේශපත්‍ර වෙන්කරවා ගැනීමට හැකි ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර පද්ධතියක් හඳුන්වාදීම | 7.5 |
| | ග්‍රාමීය ප්‍රදේශවල ධාවනය සඳහා ලංගමයට බස් රථ 600ක් මිලදී ගැනීම | 3.2 |
| | මහව-ඕමන්ත දුම්රිය මාර්ගයේ කිලෝමීටර් 130ක්, මහනුවර-පේරාදෙණිය-කඩුගන්නාව දුම්රිය මාර්ගය කිලෝමීටර් 10ක් ප්‍රතිසංස්කරණය කිරීම | 6.5 |
| | දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා මගී මැදිරි 160 ක්, ඩීසල් බහුකාර්ය ඒකක 2 ක්, ට්‍රැක් වැගන් 20 ක් සහ ටැංකි වැගන් 30 ක් මිලදී ගැනීම | 1.2 |
| නඩත්තු | ජාතික මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම | 9.4 |
| | දුම්රිය මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම | 2.5 |
| | දුම්රිය ඇණිය සහ සංඥා පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ අලුත්වැඩියා කිරීම | 7.0 |
| මෙහෙයුම් වියදම් | මාර්ග සංවර්ධන අධිකාරියේ වැටුප් සහ අනෙකුත් වියදම් | 9.0 |
| | ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වැටුප්, අතිකාල සහ අනෙකුත් දීමනා | 11.3 |
| | දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධන සැපයීම | 17.2 |
| **ජනතාවට සහන** | පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදීම | 10.0 |
| | සන්නද්ධ හමුදාවන්ට බස් බලපත්‍ර ලබාදීම | 0.2 |
| | ලාභ නොලබන මාර්ගවල බස් රථ ධාවනය කිරීම | 4.0 |
| | දිවයින පුරා ප්‍රවාහන සේවා පවත්වා ගැනීම සඳහා සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය රාත්‍රී සේවා සඳහා බස්රථ 1560ක් යෙදවීම | 2.0 |
| අයවැය යෝජනා | මාර්ග නඩත්තු අරමුදලක් පිහිටුවීම | 0.1 |
| | ගංවතුරින් හානියට පත් මාර්ග සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම , ගරාගොඩ පාලම අලුත්වැඩියා කිරීම සහ බදුල්ල රජ මාවතේ ඉතිරි වැඩ අවසන් කිරීම | 2.0 |

# දැරිය හැකි සහ තෘප්තිමත් ජීවිතයක් සඳහා පහසුකම්

## 2023 දී නාගරික සංවර්ධනය, ජල සම්පාදන සහ නිවාස සංවර්ධනය සඳහා රුපියල් බිලියන 132 ක්

ආරක්ෂිත පානීය ජල ප්‍රවේශය - ජනගහනයෙන් 95.8%

නල ජල ප්‍රවේශය - ජනගහනයෙන් 55.7%

නල මලාපවහන ප්‍රවේශය - ජනගහනයෙන් 2.1%

ජල සැපයුම් සම්බන්ධතා - මිලියන 2.7

නල යෝජනා සඳහා ජල නිෂ්පාදනය - ඝන මීටර් මිලියන 815




### *ජල සැපයුම සඳහා රුපියල් බිලියන 81 ක්*

| | |
|---|---|
| ජල සම්පාදන යෝජනා ක්‍රම සංවර්ධනය | රු. බි. 66.7 |
| ජල පවිත්‍රාගාරවල ධාරිතාව වැඩි දියුණු කිරීම | රු. බි. 8.0 |
| සනීපාරක්ෂක / මලාපවහන පහසුකම් සංවර්ධනය | රු. බි. 6.7 |



### *නාගරික සංවර්ධන හා නිවාස සඳහා රුපියල් බිලියන 51 ක්*

| | |
|---|---|
| නාගරික සංවර්ධනය | රු. බි. 11.6 |
| නිවාස සංවර්ධනය | රු. බි. 24.3 |
| වතු නිවාස | රු. බි. 4.8 |
| අපද්‍රව්‍ය කළමනාකරණය සහ පරිසර ආරක්ෂණය | රු. බි. 8.4 |
| ගංවතුර කළමනාකරණය | රු. බි. 1.1 |
| වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය | රු. බි. 0.7 |






## අංශයේ විශේෂ ආයෝජන

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලියන) |
|---|---|---|
| නල ජල සැපයුම සැපයීම | කුණ්ඩසාලේ, හාරිස්පත්තුව, පාතදුම්බර, පූජාපිටිය, අකුරණ සහ යටිනුවර ප්‍රදේශවල නිවාස 75,000කට නළ ජල සැපයුම ලබාදීම | 10.0 |
| | දිවයින පුරා තෝරාගත් ජල සම්පාදන යෝජනා ක්‍රම 246 ක ආවරණය වැඩි දියුණු කිරීම, ධාරිතාව සහ තත්ත්ව වැඩිදියුණු කිරීම | 12.0 |
| | දිවයින පුරා ඇති ප්‍රජා මූලික ජල යෝජනා ක්‍රමවලින් නව ජල සැපයුම් සම්බන්ධතා ලබා දීම | 1.5 |
| | යාපනය, නල්ලූර්, වේලනෛයි, කයිට්ස්, චෙන්කනායි, පලෛයි යන ප්‍රදේශවල ඉදිකරන මුහුදු ජලය පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථානය, කුළුණු සහ බෙදාහැරීමේ මාර්ගය හරහා නිවාස 60,000කට පානීය ජලය සැපයීම | 7.5 |
| | මාලිගාකන්ද, පාමංකඩ, කොළඹ-දකුණ සහ බටහිර ඇතුළු කොළඹ නගර සභා බල ප්‍රදේශයේ ජල පහසුකම් වැඩි කිරීම | 7.5 |
| | මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 3,500කට පානීය ජලය ලබාදීම | 2.0 |
| | නුවරඑළිය, මොණරාගල, බදුල්ල, කෑගල්ල, රත්නපුර, කිලිනොච්චි, මුලතිව් දිස්ත්‍රික්ක සඳහා පවතින යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කරමින් පානීය ජලය සැපයීම | 5.3 |
| | මාතලේ, උකුවෙල, රත්තොට, නාවුල, යටවත්ත, පල්ලේපොල, අඹන්ගඟ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 90,000කට පානීය ජල පහසුකම් ලබාදීම | 1.9 |
| | රුවන්වැල්ල, බුලත්කොහුපිටිය, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල නිවාස 6,500කට පානීය ජලය ලබාදීම | 3.3 |
| | පදවිය, හොරොව්පතාන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව සහ රඹෑව ප්‍රදේශවල නිවාස 25,000 කට පමණ පානීය ජලය සැපයීම | 2.0 |
| ජල පිරිපහදු යන්ත්‍රවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | බලශක්ති ඉතිරිකිරීම් තුළින් කොළඹ මහ නගර සභාව , කඩුවෙල, කෝට්ටේ, කොලොන්නාව සහ ශ්‍රී -ජයවර්ධනපුර ප්‍රදේශවලට ජල සැපයුමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 12.0 |
| සනීපාරක්ෂක / මලාපවහන සංවර්ධනය | මහනුවර මහානගර බලප්‍රදේශය, යටිනුවර, රත්මලාන, මොරටුව, කැලණිය, මීගමුව මහානගර සභා බලප්‍රදේශය , ගාල්ල මහානගර බලප්‍රදේශය, උණවටුන, කැලණිය සහ පෑලියගොඩ ප්‍රදේශයට මලාපවහන පහසුකම් සැපයීම | 2.7 |

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | **2023** ආයෝජනය **(**රු. බිලියන**)** |
|---|---|---|
| නිවාස සංවර්ධන | 601 වත්ත (ඒකක 450), කොලොන්නාව (336), රජමහ වීදිය-මහරගම (ඒකක 600), විල්ගොඩ-කුරුණෑගල (ඒකක 300), කොලඹගේ මාවත (ඒකක 615), ටොරින්ටන් මාවත (ඒකක 115), පෑලියගොඩ (ඒකක 615), දෙමටගොඩ (ඒකක 586), මහරගම (ඒකක 112), පලතුරු වත්ත -කොට්ටාව (108), මොරටුව (ඒකක 575) ලෙස නිවාස 4,400 කට වැඩි ප්‍රමාණයක් ඉදිකිරීම | 23.0 |
| | නුවරඑළිය, බදුල්ල, මහනුවර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල වතු කම්කරුවන් සඳහා නිවාස ඒකක 14,000ක් ඉදිකිරීම | 4.8 |
| අපද්‍රව්‍ය කළමනාකරණය සහ පරිසර ආරක්ෂණය | මහ කොළඹ නාගරික ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවලින් දිනකට ටොන් 1,200ක් පමණ එක්රැස් වන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් සැපයීම | 5.0 |
| | කැලණිය, වත්තල, කොලොන්නාව ප්‍රදේශවල ගංවතුර තත්ත්වයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය පරිදි ඇළ මාර්ග, පොම්පාගාර, බැමි සකස් කිරීම | 1.1 |
| උපාය මාර්ගික නගර සංවර්ධනය | වාණිජ සහ පොදු පහසුකම්, සහ අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් නගර 100ක් සංවර්ධනය කිරීම | 4.5 |
| | යාපනය සහ අනුරාධපුර නගරවල මාර්ග ප්‍රතිසංස්කරණය, රථවාහන කළමනාකරණය සහ පොදු ප්‍රවාහනය, කාණු ප්‍රතිසංස්කරණය, පොකුණු සංරක්ෂණය සහ රෝන්මඩ ඉවත් කිරීමේ කටයුතු | 0.9 |

# "ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම"

## කෘෂිකර්මය, වාරිමාර්ග, ධීවර හා වැවිලි සඳහා ආයෝජනය - රු: බිලියන 236





| **ප්‍රාදේශීය ක්‍රියාකාර කම් 2023** | **ක්‍රියාකාරකම්** | **ආයෝජනය (රු. බිලියන)** |
|---|---|---|
| පොහොර ගබඩා ඉදිකිරීම | • දිස්ත්‍රික්ක 23ක පොහොර ගබඩා 40 ක් ඉදිකිරීම | 0.3 |
| දායක බෝග රක්ෂණය යෝජනා ක්‍රමය | • තෝරාගත් බෝග 6 ක (වී, බඩ ඉරිඟු, බී-ලූණු, අර්තාපල්, මිරිස්, සහ සෝයා බෝංචි) පාඩු සඳහා වන්දි ගෙවීම | 1.0 |
| අතහැර දැමූ වී ඉඩම් නැවත වගා කිරීම | • දිවයින පුරා අත්හැර දැමූ ඉඩම් හෙක්ටයාර 21,495ක නැවත වී වගා කිරීම | 3.0 |
| දේශගුණය සුහුරුවාරි කෘෂිකර්මය | • වැව් 400ක් ප්‍රතිසංස්කරණය කිරීම හා හෙක්ටයාර 15,000 ඉඩම් වගා කිරීම | 3.3 |
| කෘෂිකර්ම අංශය නවීකරණය | • දිස්ත්‍රික්ක 12 ක පොකුරු ගම්මාන 36 (කෘෂිකාර්මික තාක්ෂණ ආදර්ශ උද්‍යාන) ඉදිකිරීම් සහ ගොවි නිෂ්පාදක සංවිධාන | 7.8 |
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා හවුල්කාරිත්වය | • ගොවීන් 10,500කගේ වගාවන් වාණිජමය වශයෙන් නගා සිටුවීම සඳහා පහසුකම් සැලසීම | 6.4 |
| බීජ සහ රෝපණ ද්‍රව්‍ය | • උඩරට සහ පහතරට එළවළු බීජ නිෂ්පාදනය සහ මිලදී ගැනීම | 2.0 |
| ආහාර සුරක්ෂිතතාව | • තෝරාගත් බෝග 16ක් වගා කිරීම සඳහා දිවයින පුරා ඉඩම් හෙක්ටයාර 15ක් යොදා ගැනීම | 0.9 |
| බෝග විවිධාංගීකරණය | • අනුරාධපුර සහ වව්නියා දිස්ත්‍රික්ක වල බෝග විවිධාංගීකරණය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග වැඩිදියුණු කිරීම් | 0.05 |
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා ඔරොත්තු දීමේ වැඩසටහන | • ගොවීන් 40,000 වෙනුවෙන් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තන ධාරිතාව ශක්තිමත් කිරීම | 0.7 |

| | | |
|---|---|---|
| ජාතික ශාක නිරෝධායන මධ්‍යස්ථානය | •කටුනායක ජාතික ශාක නිරෝධායන මධ්‍යස්ථානයේ රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 0.05 |
| අතිරේක බෝග වගා වැඩසටහන | • පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල අක්කර 11,272 ක කහ, ඉඟුරු, උළුඳු සහ මුං වගා කිරීම | 0.1 |
| අයවැය යෝජනා | • පසු අස්වනු හානි අවම කිරීම සහ ගබඩා කිරීම වැඩි දියුණු කිරීම | 0.15 |
| | • කෘෂිකර්මාන්තයේ තරුණයන් රඳවා තබා ගැනීම | 0.12 |




| | | |
|---|---|---|
| පශු සම්පත් සංවර්ධනය හා පුහුණු කිරීම | • දිවයින පුරා උසස් තත්ත්වයේ වැස්සි පැටවුන් ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම<br>• සත්ත්ව පාලන ඩිප්ලෝමා වැඩසටහන | 0.33 |
| දියර කිරි පරිභෝජනය වැඩි දියුණු කිරීම | • නැවුම් කිරි නිෂ්පාදනය සඳහා උසස් තත්ත්වයේ පැටවුන් සහ උපකරණ සැපයීම | 0.05 |
| සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍යය | • දිවයින පුරා පශු සම්පත් අංශයේ රෝග පාලනය සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම | 0.33 |
| එළු පාලනය | • මඩකලපුව දිස්ත්‍රික්කයේ පවුල් 4,310ක් අතර එළුවන් බෙදා දීම | 0.15 |
| කුඩා කිරි සමූපකාර සමිති | • දිවයින පුරා ග්‍රාමීය කිරි සංස්ථා සමිති වැඩිදියුණු කිරීම | 0.84 |
| කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය | • පශු සම්පත් අභිජනනය සහ පෝෂණය සඳහා 50% ක සහනාධාරය | 0.27 |
| සත්ත්ව අභිජනන ගොවිපල | • දිවයින පුරා අභිජනන ගොවිපල සහ පහසුකම් වැඩිදියුණු කිරීම | 0.05 |
| අයවැය යෝජනාව | • දියර කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම | 0.10 |




| | | |
|---|---|---|
| කුඩා සහ සුළු පරිමාණ වාරිමාර්ග පද්ධති | • දිවයින පුරා සුළු වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම | 2.29 |

කෘෂිකර්මය

| | | |
|---|---|---|
| මධ්‍යම සහ විශාල වාරිමාර්ග පද්ධති | • දිවයින පුරා මධ්‍යම හා මහා පරිමාණ වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම | **10.2** |
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | • වයඹ පළාත් ඇළ ඉදිකිරීම සහ මිනිපේ වම් ඉවුර ඇළ වැඩිදියුණු කිරීම | **43.0** |
| දේශගුණික විපර්යාස ඔරොත්තු දීමේ හැකියාව සහ ගංවතුර අවම කිරීම | • ගංවතුරෙන් මිනිසුන්, දේපල සහ කෘෂිකාර්මික ඉඩම් ආරක්ෂා කිරීම. ගිංගඟ ආශ්‍රිත හෙක්ටයාර 5,000ක පවුල් 20,000ක්, නිල්වලා ගඟ ආශ්‍රිත හෙක්ටයාර් 5,060ක පවුල් 12,000ක්, කළු ගං ද්‍රෝණිවල හෙක්ටයාර් 200ක පවුල් 5, 000ක් | **6.40** |
| කෘෂිකාර්මික කටයුතු සඳහා වාරි පද්ධති සංවර්ධනය | • වාරි පද්ධති කළමනාකරණය සඳහා ගොවිජන ප්‍රජාවන් සවිබල ගැන්වීම<br>• කෘෂිකර්මාන්තයට සහ මිරිදිය මසුන් ඇල්ලීමට ජල සැපයුම<br>• කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් | **12.25** |
| අයවැය යෝජනා | • කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන 10ක් පිහිටුවීම | **0.25** |
| | • මා ඔය, අත්තනගලු ඔය සහ බෙන්තර ගඟ අවට ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම | **0.50** |




| | | |
|---|---|---|
| පර්යේෂණ සහ සංවර්ධන (තේ, රබර් සහ පොල්) | • තේ දළු නෙලන යන්ත්‍ර හඳුන්වා දීම<br>• බීජ උද්‍යාන පිහිටුවීම සහ දේශගුණයට ඔරොත්තු දෙන බීජ සංවර්ධනය<br>• දිගු සේවා<br>• රබර් අංශය සංවර්ධනය සඳහා රසායනාගාරය | **0.50** |
| කුඩා පරිමාණ තේ වගාව | • කුඩා තේ වතු හිමියන් සඳහා අනුබද්ධ වැඩසටහන | **0.70** |
| වතුකරයේ ඉඩම් නිසි ලෙස පරිහරණය කිරීමට සැලසුම් කිරීම | • කලාපීය වැවිලි සමාගම් සඳහා කැඩැස්තර සමීක්ෂණය | **0.04** |
| කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වගාකරුවන් | • කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වගාකරුවන් සඳහා සහනාධාර වැඩසටහන | **0.70** |
| කුඩා හා මධ්‍ය පරිමාණ පොල් වගාකරුවන් | • කුඩා හා මධ්‍ය පරිමාණ පොල් වගාකරුවන් සඳහා සහනාධාර වැඩසටහනක් | **0.45** |
| සුළු බෝග වගාව | • අපනයන බෝග සංවර්ධනය සහ අගය එකතු කිරීම | **0.40** |

| | | |
|---|---|---|
| කෘෂිකාර්මික අංශය නවීකරණය (වතු අංශය සඳහා සංරචක) | • වැවිලි බෝග නවීකරණය සඳහා මුදල් ආධාර | 4.00 |
| කුඩා තේ සහ රබර් පුනර්ජීවනය | • නව පැළ සිටුවීම සහ නැවත වගා කිරීම සඳහා සහනාධාර වැඩසටහන | 1.50 |




| | | |
|---|---|---|
| ධීවර වරායන් සහ නැංගුරම්පළ සංවර්ධනය | ගන්දර, මයිලඩි, දොඩන්දූව ධීවර වරායන් සහ රැකව, වෙල්ලමංකර නැංගුරම්පළ සංවර්ධනය කිරීම සහ කළපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය කිරීම | 3.05 |
| ඔරුවැල්ල පුවත්පත සහ ධීවර නවෝදය ගුවන් විදුලි වැඩසටහන | ඔරුවැල්ල පුවත්පත මුද්‍රණය කිරීම සහ ධීවර නවෝදය ගුවන් විදුලි වැඩසටහන සඳහා මෙහෙයුම් පිරිවැය | 0.012 |
| වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය වැඩිකිරීම සඳහා මත්ස්‍ය ජනාවාස නිර්මාණය කිරීම | මන්නාරම දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයේ මුහුදේ මුහුදු පත්ලේ බස් රථ 60ක් ස්ථානගත කිරීම සහ පතුලට නැංගුරම් ලෑම | 0.03 |
| අයවැය යෝජනාව | මිරිදිය ධීවර කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා දැනට පවතින මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල ධාරිතාව වැඩි කිරීම | 0.10 |



## සහනාධාර සඳහා රු. බිලියන 63.9 ක්

| | | |
|---|---|---|
| රසායනික හා කාබනික පොහොර සඳහා සහනාධාරය | දිවයින පුරා 900,000 කට ආසන්න වී ගොවීන් සඳහා සහනාධාර වැඩසටහන | 56.26 |
| කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය | දිවයින පුරා ගොවීන් 170,000 කට ආසන්න ප්‍රමාණයක් සඳහා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 4.75 |
| බහුදින ධීවර යාත්‍රා සඳහා චන්ද්‍රිකා තාක්ෂණ පහසුකම් | මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සඳහා VMS මෘදුකාංගය සඳහා දායකත්ව සහ දායක ගාස්තු ගෙවීම | 0.029 |
| ධීවර ප්‍රජාව සහ සමුද්‍රීය ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම | ජාත්‍යන්තර නියෝජිතායතන සඳහා දායකත්ව සහ දායක ගාස්තු ගෙවීම් (එනම් ජලජීවී වගා | 0.067 |

| | | |
|---|---|---|
| | මධ්‍යස්ථාන ජාලය, ඉන්දියන් සාගර ටූනා කොමිසම, INFOFISH ආදිය) | |
| 'දියවර දිරිය' ණය යෝජනා ක්‍රමය | ලංකා බැංකුව හරහා ක්‍රියාත්මක "දියවර දිරිය" ණය යෝජනා ක්‍රමය සඳහා පොලී සහනාධාරය | **0.019** |
| වී අලෙවි මණ්ඩලය | වී ගොවීන්ගෙන් මිලදී ගැනීම හේතුවෙන් රාජ්‍ය බැංකු වෙත කාලීන ණය ආපසු ගෙවීම | **2.87** |

කෘෂිකර්මය

## ඉඩම් සඳහා රුපියල්. බිලියන 10.3 ක්

| | | |
|---|---|---|
| කෘෂිකර්මාන්තය සඳහා ඉඩම් සංවර්ධනය | •කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් වැඩිදියුණු කිරීම් සහ කළමනාකරණය | **10.35** |

# “තිරසාර සංවර්ධනය සඳහා පරිසර සංරක්ෂණය ”

## පරිසරය, වන සංරක්ෂණය සහ වනජීවී සඳහා ආයෝජන - රුපියල් බිලියන 10.8




| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය )රු .බිලියන( |
|---|---|---|
| පරිසර සංරක්ෂණය | • රාජ්‍ය නිලධාරීන්, පාසල් සිසුන්, උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා පස හා ජලය සංරක්ෂණය කිරීම සඳහා දීප ව්‍යාප්ත පුහුණු කිරීම් | 0.17 |
| "සුරකිමු ගංගා" | • දූෂණ වලින් ගංගා ආරක්ෂා කිරීම, ජලාශ, ජල මඩු සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම | 0.05 |
| ප්‍රජාව ඒකාබද්ධ කිරීම සහ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම | • ගෝලීය වශයෙන් වැදගත් ජෛව විවිධත්වය ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම | 0.05 |
| කෘෂි වන වගාව සහ අනෙකුත් ඉඩම් පරිහරණ අංශ | • වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශවල ප්‍රජාවන් ඒකාබද්ධ කිරීම<br>• ඉඩම් පරිහරණ අංශයේ ආයතන සහ පාර්ශවකරුවන් සඳහා දීප ව්‍යාප්ත ධාරිතා සංවර්ධන වැඩසටහන් | 0.15 |
| සෞඛ්‍ය සම්පන්න ජනගහනයක් සහ සමෘද්ධිමත් ජීවන රටාවක් ඇති කිරීම | • පාරිසරික හා සමාජීය වශයෙන් සංවේදී කෘෂි-පාරිසරික ස්ථාපිත කිරීම තුළින් ඉඩම් හායනය අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම | 0.07 |
| අයවැය යෝජනාව | • වන ආවරණය වැඩි කිරීමට ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම | 0.05 |

පරිසරය




| | | |
|---|---|---|
| පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණය | • යාල සහ සිංහරාජයේ නරඹන්නන් මධ්‍යස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතිය<br>• නකල්ස් සංචාරක නේවාසිකාගාර ඉදිකිරීම් කටයුතු<br>• අම්පාර, නුවරඑළිය සහ ගිරිතලේ පශු වෛද්‍ය රෝහල් ඉදිකිරීම් කටයුතු | **2.30** |
| වනාන්තර ආවරණය පුළුල් කිරීම | • දිවයින පුරා කාර්මික වැවිලි නිෂ්පාදන වැඩිදියුණු කිරීම<br>• පාරිසර හිතකාමී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | **0.80** |
| විදුලි වැට ඉදිකිරීම | • ආසන්න වශයෙන් කි.මී 4,000 ක දැනට පවතින විදුලි වැටවල් නඩත්තු කිරීම සහ නව විදුලි වැට ඉදිකිරීම(200 කි.මී) | **0.10** |
| සත්වෝද්‍යාන නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම | • පිහිටා ඇති සත්වෝද්‍යානවල පහසුකම් සහ නඩත්තු කටයුතු වැඩිදියුණු කිරීම (පින්නවල, රිදීගම සහ දෙහිවල) | **0.16** |

# "සාධාරණ සහ සාමකාමී සමාජයක් උදෙසා වූ කැපවීම "

## මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු උදෙසා 2023 වසරේදී රු. බිලියන 210 ක්





අධිකරණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සඳහා රු. බිලියන 22.6




ප්‍රජාතාන්ත්‍රික පාලනය සඳහා රු. බිලියන 17.1



මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සඳහා රු. බිලියන 158.9



බන්ධනාගාර හා පුනරුත්ථාපනය සඳහා රු. බිලියන 10.7

## සාධාරණ සහ සාමකාමී සමාජයක් උදෙසා වූ කැපී කැපී පෙනෙන ආයෝජනයන්

| ක්ෂේත්‍රය | විස්තරය | රු. බිලියන |
|---|---|---|
| **අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු** | මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීම පිණිස වූ පුද්ගල පඩිනඩි | 19.0 |
| | I. රත්නපුර,වැලිමඩ, සහ ගාල්ල උසාවි සංකීර්ණයන්හි ඉදිකිරීම් කටයුතු නිමා කිරීම<br>II.උපරිමාධිකරණ සංකීර්ණය නවීකරණය කිරීම<br>III අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා වූ තුන් අවුරුදු සැලසුම | 1.3 |
| | සමාජ ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය ශක්තිමත් කිරීම | 0.2 |
| | අපරාධ යුක්ති පද්ධතිය තුළ, අධිකරණ විද්‍යාත්මක මත්ද්‍රව්‍ය විශ්ලේෂණය සම්බන්ධයෙන් ධාරිතා වර්ධනය සඳහා පහසුකම් සැලසීම | 0.3 |
| | "කාර්යක්ෂම සහ ඵලදායී යුක්තිය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම | 0.2 |
| **මහජන ආරක්ෂාව** | මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීම පිණිස වූ පුද්ගල පඩිනඩි | 116.5 |
| | ගෝලීය පාලනය ශක්තිමත් කිරීම, පොලිස් අභ්‍යාස ආයතනය හා පුහුණු විද්‍යාල වැඩි දියුණු කිරීම, සාම සාධක මෙහෙයුම් | 0.5 |
| | ප්‍රසම්පාදනය හා සම්බන්ධ කාර්යයන් සඳහා මූල්‍යයමය සහාය සැලසීම | 8.8 |
| **ප්‍රජාතාන්ත්‍රික පාලනය** | මහජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ශක්තිමත් කිරීම හා සමාජයේ මානව හිමිකම් තහවුරු කිරීම | 7.1 |
| | නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම | 10.0 |
| **බන්ධනාගාර හා පුනරුත්ථාපන** | මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීම පිණිස වූ පුද්ගල පඩිනඩි | 8.0 |
| | වීරවිල, යාපනය, පල්ලේකැලේ, වටරැක, පල්ලන්සේන, වාරියපොල සහ බස්නාහිර පළාතේ බන්ධනාගාර ඉදිකිරීම් සහ පුනරුත්ථාපන කටයුතු සඳහා පහසුකම් සැලසීම | 0.5 |
| | බන්ධනාගාර රැඳවියන්ගේ සෞඛ්‍යාරක්ෂක පහසුකම් ඉහළ නැංවීම | 0.2 |
| අයවැය යෝජනා | සුරාබදු දෙපාර්තමේන්තුවට නව රසායනාගාරයක් ඉදි කිරීම | 0.1 |
| | සිරකරුවන් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම | 0.1 |

# ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම

## ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2023 වර්ෂයේදී

## රු. බිලියන **367** ක්



**ජාතික ආරක්ෂාව සඳහා රු. බිලියන 364.7**



**රණවිරු මව්පිය රැකවරණ සඳහා රු. බිලියන 2.3**

### ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වූ කැපී පෙනෙන ආයෝජනයන්

| ක්ෂේත්‍රය | විස්තරය | රු. බිලියන |
|---|---|---|
| ජාතික ආරක්ෂාව | මෙහෙයුම් කටයුතු සඳහා සහය වීමට පුද්ගල පඩිනඩි ලබාදීම | 257 |
| | ප්‍රතිලාභීන් 257,555 ක් සඳහා රණවිරු මාපිය රැකවරණ දීමනාව ගෙවීම | 2.3 |
| | අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ලේ අංක 1,2,3 හා 4 ගොඩනැගිලි සාදා නිම කිරීම | 7.0 |
| | යුද්ධ හමුදා රෝහල් ගොඩනැගිල්ලේ සැකිල්ලේ කටයුතු අවසන් කිරීම සහ අනෙකුත් ඉදිකිරීම් අඛණ්ඩව කරගෙනයාම | 0.5 |
| | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හා නාවික හමුදාවේ වීඑච්එෆ් යූඑෆ්එච් (VHF UHF) සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීමේ අදියර 1 සම්පූර්ණ කිරීම | 1.0 |

කර්මාන්ත

# ආර්ථික වර්ධනයේ ගාමක බලවේග

## 2023 දී වෙළෙඳ, කර්මාන්ත සහ ආර්ථික සේවා සඳහා රුපියල් බිලියන 159

### *වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතාව සඳහා රුපියල් බිලියන 6ක්*

| | |
|---|---|
| වෙළඳ සහ සමුපකාර සංවර්ධනය | රු. බි. 3.9 |
| වෙළඳ ප්‍රවර්ධනය, ආහාර සුරක්ෂිතතාව සහ සමුපකාර සංවර්ධනය සම්බන්ධ මෙහෙයුම් කටයුතු | රු. බි. 2.1 |



### *තාක්ෂණික සංවර්ධනය සඳහා රුපියල් බිලියන 11.6 ක්*

| | |
|---|---|
| රාජ්‍ය ආයතන සහ සංවර්ධන කටයුතු | රු. බි. 8.3 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීම සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | රු. බි. 3.0 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | රු. බි. 0.2 |

### *කර්මාන්ත සංවර්ධනය සඳහා රුපියල් බිලියන 8.2 ක්*



| | |
|---|---|
| SMEs ප්‍රවර්ධනය කිරීම | රු. බි. 3.0 |
| කාර්මික සංවර්ධනය | රු. බි. 2.4 |
| ආයතන හරහා කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම | රු. බි. 2.0 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | රු. බි. 0.8 |


### *කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන සම්පත් සහතික කිරීම සඳහා රුපියල් බිලියන 72ක්*



| | |
|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන සම්පත් වෙත ප්‍රවේශ වීමට සහාය වීම | රු. බි. 50.8 |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බැංකු ගිණුමේ පොලී වෙනස | රු. බි. 10.0 |
| අභ්‍යන්තර ප්‍රේෂණ සඳහා දිරි දීමනා | රු. බි. 4.5 |
| වෙනත් ණය සහ ණය පහසුකම් | රු. බි. 6.9 |

## *ආයෝජන ප්‍රවර්ධනය සඳහා රුපියල් බිලියන* **7.25** *ක්*

| | |
|---|---|
| ආයෝජන ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම | රු. බි. 1.6 |
| ආගමන පාලනය සහ පුරවැසිභාවය | රු. බි. 5.2 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | රු. බි. 0.4 |



## *බලශක්තිය සඳහා රුපියල් බිලියන* **52.0** *ක්*

| | |
|---|---|
| පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම | රු. බි. 15.0 |
| බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | රු. බි. 37.2 |

## *සංචාරක ව්‍යාපාරය සඳහා රුපියල් බිලියන* **0.9** *ක්*

| | |
|---|---|
| උද්භිද උද්‍යාන සංවර්ධනය | රු. බි. 0.8 |
| සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය | රු. මි. 30 |
| මෙහෙයුම් වියදම් | රු. මි. 90 |

## අංශයේ විශේෂ අවස්ථා

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලියන) |
|---|---|---|
| කාර්මික සංවර්ධනය | එක් නව කර්මාන්තපුරයක් පිහිටුවීම සහ දැනට පවතින කර්මාන්තපුර 32 ක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 1.0 |
| | කාර්මික ප්‍රවර්ධනයට අදාළ ඵලදායිතාව, පර්යේෂණ සහ සංවර්ධනය, නවෝත්පාදන, කුසලතා, තත්ත්ව වැඩිදියුණු කිරීම සහ වෙළඳපළ ප්‍රවර්ධනය වැඩි කිරීම | 0.3 |
| | රෙදිපිළි නිෂ්පාදනය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා විශේෂිත කලාපයක් නිර්මාණය කිරීම | 0.26 |
| SMEs ප්‍රවර්ධනය කිරීම | සුදුසුකම් ඇති ක්ෂුද්‍ර හා කුඩා කර්මාන්ත / ව්‍යවසායන් සඳහා අඩු පොලී ණය ලබා දීම | 2.0 |
| | පරිසර හිතකාමී විසඳුම ක්‍රියාත්මක කිරීම සඳහා කාර්මික ව්‍යවසායන් සඳහා අඩු පොලී ණය ලබා දීම | 1.0 |
| | කාර්මික සංවර්ධන මණ්ඩලයේ නිසි ක්‍රියාකාරිත්වය තුළින් කාර්මික වතු කළමනාකරණය සහ තාක්ෂණය කර්මාන්ත වෙත මාරු කිරීම | 0.75 |

කර්මාන්ත

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලියන) |
|---|---|---|
| කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම | ජාතික ශිල්ප සභාව, රෙදිපිළි දෙපාර්තමේන්තුව සහ තාක්ෂණ භුවමාරුව, පර්යේෂණ සහ සංවර්ධන, නවෝත්පාදන සහ කර්මාන්ත සඳහා නව නිර්මාණ සැපයීම පිළිබඳ ජාතික නිර්මාණ මධ්‍යස්ථානය වැනි ආයතනවලට පහසුකම් සැලසීම | 2.0 |
| වෙළඳ සහ සමුපකාර සංවර්ධනය | යාපනය, වවුනියාව, මඩකලපුව සහ කිලිනොච්චිය යන ප්‍රදේශවල ආර්ථික මධ්‍යස්ථාන 4ක් පිහිටුවීම | 0.025 |
| | පලතුරු සහ එළවළුවල පසු අස්වනු පාඩු අවම කිරීම සඳහා උෂ්ණත්ව පාලන ගබඩාවක් දඹුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කිරීම | 0.15 |
| | අන්තර්ජාල පහසුකම් සහිත සමුපකාර අලෙවිසැල නවීකරණය කිරීම | 0.03 |
| | ලක් සතොස නවීකරණය | 0.025 |
| ආයෝජන ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම | කොළඹ වරාය නගර ප්‍රදේශයේ මලාපවහන පද්ධතියක් ඉදිකිරීමට CMC වෙත සහය වීම | 0.95 |
| තාක්ෂණය | රටේ පුරවැසියන් සඳහා විද්‍යුත් හැඳුනුම්පත නිකුත් කිරීමේ පහසුකම් සංවර්ධනය | 0.45 |
| | LGN 2.0, LGC සහ රජයේ තොරතුරු තාක්ෂණ වේදිකාව නඩත්තු කිරීම සඳහා සහාය | 4.6 |
| මූල්‍ය සහ මූල්‍ය නොවන සම්පත් වෙත ප්‍රවේශ වීමට සහාය වීම | කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ණය ලබා දීම<br>• කාන්තා ව්‍යවසායක මූල්‍ය මුලපිරීම්(We-Fi)ප්‍රදානය,<br>• COVID බලපෑමට ලක් වූ MSME සඳහා ස්ථිර කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා හදිසි ප්‍රතිචාර සංරචකය (ERC)<br>• කුඩා තේ වතු හිමියන්ගේ ණය මාර්ගය | 30.73 |
| | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ධාරිතාවය සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා තාක්ෂණික සහය, වෙළඳපල සහය සහ නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය ඇතුළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය සහ මූල්‍ය නොවන සහාය ලබා දීම | 1.54 |
| | ඇපකර අවශ්‍යතා සපුරාලීමට අපහසු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන මූල්‍ය බාධක සඳහා ප්‍රවේශය සහතික කිරීම සඳහා ජාතික ණය සහතික කිරීමේ ආයතනයක් පිහිටුවීම | 18.5 |

| ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම් | 2023 ආයෝජනය (රු. බිලියන) |
|---|---|---|
| | ජය ඉසුර, සොඳුරු පියස, රන් අස්වැන්න, සිහින මාලිගා යනාදි ණය යෝජනා ක්‍රම | 6.9 |
| පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම | පරිසර හිතකාමී සම්පත් සමඟ අඩු වියදමකින් බලශක්ති ප්‍රභවයන් කළමනාකරණය කිරීම සඳහා පොසිල ඉන්ධනවල සිට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත මාරු වීම සඳහා සූර්ය බලශක්ති උත්පාදනය සඳහා වන ණය යෝජනා ක්‍රමය | 15.0 |
| බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | • හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය ඉදිකිරීම<br>• 30 Mw මොරගොල්ල ජල විදුලි සංවර්ධන ව්‍යාපෘතිය<br>• සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම | 36.0 |
| උද්භිද උද්‍යාන සංවර්ධනය | • ගම්පහ, අවිස්සාවේල්ල, රාජකීය උද්භිද උද්‍යානය, හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 0.8 |
| අයවැය යෝජනා | විදේශ වෙළඳාම සහ ආයෝජන සඳහා නියෝජිතායතනය පිහිටු වීම | 0.2 |
| | නව ආර්ථික කලාප ඇති කිරීම | 0.3 |
| | ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිහිටුවීම | 0.1 |
| | ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම | 0.1 |
| | කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුව පිහිටුවීම | 0.2 |
| | නොගැඹුරු මුහුදේ ආරක්ෂිත මුහුදු ප්‍රදේශ හඳුනාගෙන සංවර්ධනය කිරීම, නැගෙනහිර, දකුණ සහ බස්නාහිර පළාත්වල සමුද්‍ර සංචාරක ප්‍රවර්ධනය සඳහා අදාළ යටිතල පහසුකම් සංවර්ධනය | 0.05 |
| | විද්‍යුත් පද්ධතිය හරහා ගෙවීම් ප්‍රවර්ධනය කිරීම | 0.2 |
| | තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා ණය යෝජනා ක්‍රමය | 0.25 |

# කාර්යක්ෂමව සහ ඵලදායීව මහජන සේවා සැපයීම

## මහජන සේවා රු. බිලියන 166



### රාජ්‍ය පරිපාලනය



- රාජ්‍ය සේවා නියාමනය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම – රු. බිලියන 10.8

  ඇතුළුව

  - ✓ ගම්පහ නිල පියස - රාජ්‍ය නිලධාරීන් සඳහා නිල නිවාස නිම කිරීම – රු. බිලියන 0.08
  - ✓ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම – රු. බිලියන 0.034
  - ✓ රාජ්‍ය නිලධාරීන් පුහුණුව

### දිස්ත්‍රික් පරිපාලනය

- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය පරිපාලනය සඳහා පහසුකම් සැපයීම – රුපියල් බිලියන 53.4

  ඇතුළුව

  - ✓ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි 25 ක් නිම කිරීම – රු. මිලියන 2.34



    - ○ දිස්ත්‍රික් ලේකම් කාර්යාල – ගම්පහ, මන්නාරම, මඩකලපුව, අම්පාර, රත්නපුරය සහ කෑගල්ල
    - ○ ප්‍රාදේශීය ලේකම් කාර්යාල – හෝමාගම, වත්තල, ජා- ඇල, කළුතර , උකුවෙල, පිටබැද්දර, දුණුගම්වෙහෙර, අඟුණකොළපැලැස්ස, ආණමඩුව, මුන්දලම, නුවරගම් පළාත - මධ්‍යම, විලච්චිය, හාලි-ඇල, මහියංගනය, තණමල්විල සහ බිබිලේ

  - ✓ බිම් මට්ටමේ තොරතුරු තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා ඉ- ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය – රුපියල් මිලියන 1,500
  - ✓ යාපනය ව්‍යාපාර පහසුකම් මධ්‍යස්ථානය – රු. මිලියන 300



## පළාත් සහ පළාත් පාලන සේවා සැපයීම


- පළාත් සහ පළාත් පාලන සේවා සැපයීම සඳහා පහසුකම් සැපයීම - රු. බිලියන 30.6

  ඇතුළුව

  ✓ දේශීය සේවා වැඩිදියුණු කිරීමේ යටිතල පහසුකම් ව්‍යාපෘති 397 ක් සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 26 ක් – රු. බිලියන 6

## විදේශ සබඳතා

- රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීම සහ සහයෝගීතාව පුළුල් කිරීම
  – රු. බිලියන 19






## මූල්‍ය සහ ආර්ථිකය

- මූල්‍ය අංශය වැඩිදියුණු කිරීම සඳහා සේවා සැපයීම - රු. බිලියන 37.9

  ඇතුළුව

  ✓ සමාජ ආරක්ෂණ ජාල ඉලක්ක කිරීම වැඩිදියුණු කිරීම - රු. මිලියන 962

  ✓ මූල්‍ය අංශය නවීකරණය කිරීම - රු. මිලියන 339

  ✓ ආදායම් පරිපාලනය සහ භාණ්ඩාගාර පද්ධති කළමනාකරණය - රු. මිලියන 9,947

  ✓ සංගණන පැවැත්වීම - රු. මිලියන 1,288

## විධායක ආයතන

- විධායක ආයතන සඳහා පහසුකම් සැපයීම – රු. බිලියන 8.1



### ස්වභාවික ආපදා වලින් ආරක්ෂාව

- ආපදාවලින් මිනිසුන් ආරක්ෂිත බව සහතික කිරීම – රු බිලියන 6.8
  ඇතුළුව

  ✓ ආපදා වල බලපෑම අවම කිරීම – රු මිලියන 200
  ✓ නායයාම් අවදානම් ප්‍රදේශවලින් නැවත පදිංචි කිරීම – රු මිලියන 650
  ✓ නායයාමේ අවදානම අවම කිරීම
  ✓ – රු මිලියන 3,400
  ✓ කාලගුණික කාර්යයන් – රු මිලියන 490
  ✓





## රාජ්‍ය සේවා සැපයීම සඳහා ප්‍රතිපාදන සාරාංශය -2023


| අමාත්‍යාංශය, | 2023 ප්‍රතිපාදන (රු. බිලියන) |
|---|---|
| රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | 94.8 |
| විදේශ සබඳතා | 19.0 |
| මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති | 37.9 |
| විධායක ආයතන | 8.1 |
| ස්වභාවික ආපදා වලින් ආරක්ෂාව | 6.8 |
| එකතුව | 166.6 |

# රාජ්‍ය අංශයේ රැකියා







රාජ්‍ය අංශයේ රැකියා 2010 වර්ෂයේ 1,211,976 සිට 2022 වර්ෂයේ 1,390,267 දක්වා වර්ධනය වී ඇත

එය පසුගිය වසර 13ක කාලය තුළ 15% ක වර්ධනයක් වන අතර සාමාන්‍ය වාර්ෂික වර්ධනය 1.1% ක් වේ.


පළාත් සභා තුළ රැකියා 17% කින් වැඩිවී ඇත.


එම කාලය තුළ රජය සතු ව්‍යවසායන්හි රැකියා 8.3% කින් අඩු වී ඇත.

**ජාතික අයවැය යටතේ වැටුප් ගෙවන රාජ්‍ය සේවකයන්- 2023**



රාජ්‍ය අංශයේ රැකියා




පසුගිය වසර 13 තුළ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් සහ වේතන ගෙවීම් තුන් ගුණයකින් වැඩි වී ඇත